www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ටිබෙටයේ මර්දනය හා පන්ති ප්‍රශ්න

## Repression in Tibet: the class issues

**කර්තෘ මණ්ඩලය විසිනි**
**2008 අප්‍රේල් 15**

ලෝකයේ නගර පුරා විරෝධතා මාලාවක් ද, බීජිංහි කටයුතු පිලිබඳව බටහිර බලවතුන්ගේ විවේචන හා බීජිංහි ඔලිම්පික් තරග වර්ජනය කිරීමේ තර්ජන ද මඟින් ටිබෙටය තුල චීන පාලන තන්ත්‍රයේ මර්දනය ජාත්‍යන්තර අවධානයට පාත්‍ර ව තිබේ.

ටිබෙට් ජනතාව කෙරෙහි සිය අව්‍යාජ කනස්සල්ල නිසා බොහෝ දෙනෙකු විරෝධතාවන්ට සහභාගි වීම නිසැක වන නමුදු, සදාචාරාත්මක කෝපය ටිබෙටයෙහි දුක් වේදනාවන් අවසන් නොකරන අතර එය පහසුවෙන්ම අවභාවිතයට ද යොදාගත හැකිය. කොසෝවෝ හා නැගෙනහිර ටිමෝරයේ ජනතාව මුහුන පෑ අභාග්‍ය සම්පන්න තත්වය හදිසියේ ම ඊනියා මානවවාදී මිලිටරි මැදිහත්වීම් සඳහා පදනම ලෙස ඩැහැගැනීම නිසා ඔවුන්ට අත්ව තිබෙන ඉරනම යමෙකු සිහියට නගාගත යුතු ය. දශකයකට පසුව මෙම භූමි භාගයන් දිගට ම විදේශ හමුදා අත්අඩංගුවේ තබාගත හැකි ගනුදෙනුකාර රාජ්‍යයන් බවට පරිවර්තනය කර ඇත. මෙම මාතෘකා දෙකම සම්බන්ධයෙන් ගත්විට ජනගහනයෙන් ඉමහත් බහුතරය දරිද්‍රතාවයේ හා විර කියාවේ ගැලී සිටිති.

වේගවත් වන ගෝලීය ආර්ථික අපගමනයක ද, රටක් රටක් පාසා තියුනු වන පන්ති ආතතීන් හා උග්‍රවන අන්තර් අධිරාජ්‍යවාදී එදිරිවාදිකම්වල ද කොන්දේසි හමුවේ ආසියාවේ ද ජාත්‍යන්තරව ද විවිධ ජාතික හා වාර්ගික ප්‍රශ්න පුපුරා යමින් තිබේ. ජන මාධ්‍යය වාර්ගික පීඩාවේ එක් සුවිශේෂී කාරනයකට අවධානය යොමු කරන්නේ ද යන්න තීරනය වන්නේ සියල්ලටමත් වඩා ප්‍රධාන බලවතුන්ගේ උත්සුකයන් මඟිනි. විරෝධතා දක්වන ටිබෙට් ජාතිකයන්ට සලකන ආකාරය පිලිබඳව එක්සත් ජනපද ජනාධිපති බුෂ් කනස්සල්ල පලකරන්නේවී නමුත්, යලි ආරම්භ කල ශ්‍රී ලංකා ආන්ඩුවේ කුරිරු වාර්ගික යුද්ධයටත්, පලස්තීනුවන්ට එරෙහි ඊශ්‍රායල් පාලන තන්ත්‍රයේ මර්දනයටත් - දිගුකාලීන ජාතික ගැටුම් දෙකක් පමනක් සඳහන් කරන්නේ නම් - ඔහුගේ පාලනාධිකාරයේ සම්පූර්න සහයෝගය ලබාදෙයි.

චීනය කෙරෙහි අවධානය යොමුවීම අහම්බයක් නොවේ. පසුගිය දශක දෙක පුරා චීන ධනවාදයේ පුපුරන සුලු වර්ධනය ලෝක ගෝලයේ සෑම තැනකම දේශපාලනික හා මූලෝපායික සමබරතාවයේ ප්‍රගාඪ වෙනසක් ඇති කර තිබේ. බල ශක්තිය, අමුද්‍රව්‍ය හා උපාංග සඳහා චීනයේ දැවැන්ත හා තව තවත් වැඩිවන ඉල්ලුම ලෝකය වටා දැනටමත් පවත්නාවූ බලයන් සමඟ එය ගැටුමකට පමුනුවා ඇත. චීනය ලාභ ශ්‍රමයේ යෝධ වේදිකාවක් ලෙසත්, දැරිය නොහැකි ශ්‍රම කොන්දේසි හා පහත් වැටුප්වලට එරෙහි කම්කරුවන්ගේ විරෝධය මැඩීමේ ලා එහි පොලිස් රාජ්‍ය පාලන තන්ත්‍රය මතත් ඇමරිකානු, ජපන් හා යුරෝපීය සමාගම් විශ්වාසය තබා සිටිති. එක්සත් ජනපදය පලමු තැන ගන්නා චීනයේ එදිරිවාදීන් ඒ සමග ම, ලෝකාධිපත්‍ය සඳහා වූ තමන්ගේ ම අභිලාශයන් හා සැලසුම්වලට චීනයෙන් එල්ල වී ඇති දිගුකාලීන මූලෝපායික හා ආර්ථික තර්ජනය සමග ඔට්ටුවෙමින් සිටියි.

පසුගිය අට වසර පුරාම බුෂ් පරිපාලනය ඊසාන දිග ආසියාවේ ජපානය හා උතුරු කොරියාවේ සිට වැටී ඇති රටවල් පෙලක් සමග ද, ඕස්ට්‍රේලියාව හා දකුනු ආසියාවේ ඉන්දියාව හා පකිස්ථානය වටේට පිහිටි වයඹ දිග ආසියාවේ විවිධ රටවල් සමග ද සන්ධානයන් තර කර ගැනීමට උත්සාහ දරා ඇත. එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් ඇෆ්ගනිස්ථානය වාඩි ලා ගැනීම අන් සියල්ලටත් වඩා සම්පත් බහුල මැද පෙරදිග හා මධ්‍යම ආසියානු කලාපයේ ආධිපත්‍ය සඳහා වූ වොෂින්ටනයේ අභිලාෂයන්ගෙන් අභිප්‍රේරනය වූවකි. ටිබෙට් කලාපය වැදගත් වන්නේ එය සතු ප්‍රයෝජනයට නොගත් ඛනිජ සම්පත් මෙන්ම මධ්‍යම හා දකුනු ආසියාවට යාබදව එහි මූලෝපායික පිහිටීම හේතු කොට ගෙනය. බුෂ් පරිපාලනය කොසෝවෝ වර්ගයේ මිලිටරි මැදිහත්වීමකට ටිබෙට් බෙදුම්වාදය යොදාගැනීම සම්බන්ධයෙන් සිය අභිලාෂය දැනට කිසියම් අයුරකින් හෝ ඇඟවුම් කර නැත. එහෙත් ප්‍රශ්නය තැම්බෙමින් තිබීමට ඉඩහැරීම මගින් වොෂින්ටනය අනාගතය සඳහා විකල්පයක් ලෙස එය මිටමොලවා ගෙන සිටියි.

අද දින ගෝලීය දේශපාලනය ප්‍රථම ලෝක සංග්‍රාමයට පූර්වයෙන් ඇතිවූ මහා බලවතුන්ගේ ගැටුම් හා උපාමාරු දැමීම්වලට සිත් සසල කරන ආකාරයේ සමානකමක් දරා සිටියි. සුඩාන හා බුරුම ආන්ඩු සමග

චීන සම්බන්ධකම් ගැන නොකීවත් ටිබෙටය පිලිබඳව දක්වන සදාචාරාත්මක ආකල්පය, චීනයට බලපෑම් කිරීමටත්, එහි අභ්‍යන්තර කටයුතුවලට මැදිහත්වීමටත් එක්සත් ජනපදයට හා එහි සගයන්ට හොඳ දේශපාලන ලීවරයක්ව තිබේ. එවන් ක්‍රමෝපායන් ඒවාට ම පොදු ත්‍රකනයක් දරා සිටියි. නිර්දය ලෙස එය මෙහෙයවෙන්නේ දේශීය ගැටුම් උත්සන්න කිරීමේ දිශාවට හා නව ගෝලීය ගිනි ජාලාවක් දෙසට ය. දරිද්‍රතාවයෙන් ඇලලී ගිය ඇලස්කාවේ ස්වදේශික ඉනුඉට් ජනතාව අතර පවතින දුක්ගැනවිලි අවුලුවාලීමේ යෙදී සිටින සිය විරුද්ධවාදියෙකු හමුවේ එක්සත් ජනපදය ස්වාධීන ඇලස්කාවක් පිලි නොගනු ඇතුවාට වඩා කිසිදු අයුරකින් චීනය ස්වාධීන ටිබෙටයක් ස්වේච්ඡාවෙන් පිලි නොගනු ඇත.

බුෂ්, බ්‍රිතාන්‍ය අගමැති ගෝර්ඩන් බ්‍රවුන් හා ප්‍රන්ස ජනාධිපති නිකොලායි සාර්කෝසි වැනි "ලෝක නායකයන්" ටිබෙටය පිලිබඳව කරන උපාසක ප්‍රකාශන කුහකත්වයේ දුර්ගන්ධයෙන් පිරී ඇත. එක්සත් ජනපදය හා එහි සහකරුවන් ඉරාකය තුල සිය නව විජිතකරනයේ වාඩිලෑම බලගැන්වීම සඳහා දිනපතා සිදුකරන බිහිසුනු අපරාධ හමුවේ චීන පාලන තන්ත්‍රය ගෙනයනු ලබන මර්දනය නොවැදගත් ඡායාමාත්‍ර බවට පත්වේ. එක්සත් ජනපද පරිපාලනය රට තුලත් විදේශයන්හිත් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කෙරෙහි දක්වන පරිපූර්න සතුරුකම නිරන්තරයෙන් ප්‍රදර්ශනය කර තිබේ. ටිබෙටයේ මානව අයිතීන් පිලිබඳව දැන් කිඹුල් කඳුලු හෙලන එක්සත් ජාතීන්ගේ සංවිධානයත් ඇතුලු සියලු ආන්ඩු හා ජාත්‍යන්තර ආයතන බුෂ් පරිපාලනයේ ද, ඇෆ්ගනිස්ථානය හා ඉරාකය තුල එය ගෙනයන සාපරාධී වැඩ කටයුතුවල ද ඍජු හෝ වක්‍ර හවුල්කරුවෝ වෙති.

ජාත්‍යන්තර මාධ්‍යයේ රැවුම් ගෙරවුම් ටිබෙටය වෙත එල්ල වී තිබෙන අතර චීනය පුරා කම්කරුවන්ගේ හා ගොවීන්ගේ විරෝධතාවන් පරිපූර්න නිහඬතාවයකින් නොතකා හැර තිබේ. වසරක් පාසා චීනය තුල තුට්ටු දෙකේ සේවා කොන්දේසිවලට නිලධාරීන්ගේ දූෂනයට හා පොදු පහසුකම් නොමැතිකමට එරෙහිව දහස් ගනන් විරෝධතාවන් පැවැත්වේ. ලාෂාහි කැරලිවලට මඳකට පෙර ගුවාන්ඩොං ප්‍රාන්තයේ පන්යුහි ජපාන හිමිකම් සහිත කැසියෝ කම්හලක සේවයේ යොදවා ඇති 4000 කට වැඩි කම්කරුවෝ වැඩ වර්ජනය කලහ. සන්නද්ධ පොලිසිය සමඟ ඇතිවූ ගැටුම්වලින් කම්කරුවන් 20 කට වැඩි සංඛ්‍යාවක් තුවාල ලබා දුසිමක් පමන අත්අඩංගුවට ගනු ලැබුනි. එක් ගනන් බැලීමකට අනුව චීනයේ විශාලතම කාර්මික කලාපයක් වන පර්ල් ගංගාවේ මෝය ප්‍රදේශයෙහි අඩුම තරමින් කම්කරුවන් දහසකට වැඩියෙන් සහභාගී වන ප්‍රධාන කම්කරු අරගලයක් සෑම දිනකම ඇතිවේ.

ඒ සමග ම ටිබෙටයේ චීන මර්දනයට කිසිදු දේශපාලන සහයෝගයක් දිය නොහැකිය. ටිබෙටයේ විරෝධතාකරුවන්ට එරෙහිව බීජිනය යොදනු ලබන්නේ රටපුරා විරෝධතා මැඬීමට සාමාන්‍යයෙන් යොදාගන්නා එම පොලිස් රාජ්‍ය මර්දන ක්‍රමය ම ය. චීන බලධාරීන් අඩුම තරමින් මරන 22 ක් සිදුවූ බව පිලිගන්නා නමුත් පිටුවහලේ සිටින ටිබෙට් කන්ඩායම් කියා සිටින්නේ සංඛ්‍යාව ඊට වැඩි බවයි. ස්වාධීන ටිබෙට් කලාපයේ හා යාබද ප්‍රදේශවල පැරාමිලිටරි පොලිසියේ දහස්ගනනක් යොදවා තිබුනි. දහසකට වැඩි පිරිසක් අත්අඩංගුවට ගනු ලැබිනි. සන්නද්ධ පොලිසිය ලාෂාහි ප්‍රධාන විහාරස්ථාන මුද්‍රා තබනු ලැබූ අතර සමස්ත ජනතාව ම දැඩි සුපරික්ෂාවට යටත් කෙරුනි.

නොසංසුන්තාවය හුදෙක් චීනය තුල සිටින " දලයි ලාමා කල්ලියේ" කුමන්ත්‍රනයක්ය යන බීජිනයේ කියාපෑම්වලට කිසිදු විශ්වාසනීයත්වයක් ඇත්තේ නැත. චීනයේ පැවැත්වීමට නියමිත ඔලිම්පික් තරගයෙන් ලැබුනු අවස්ථාව අල්ලා ගෙන අරම්භක ගිනිපුපුර දලයි ලාමා ආධාකරුවන් විසින් දැල්වූවා විය හැකිය. එහෙත් ලාෂාහි විරෝධතාවන්ට ගිනිගන්නා මූලද්‍රව්‍ය සම්පාදනය කලේ බීජිනය ම ය. චීන තන්ත්‍රයට සමාජවාදය සමඟ හෝ කොමියුනිස්ට්වාදය සමඟ කිසිදු සම්බන්ධයක් ඇත්තේ නැත. බීජිංහි නිලධාරි පැලැන්තිය බලගතු හා වේගයෙන් මතුව එන ධනේශ්වරය වෙනුවෙන් පුපුල්වන ධනේශ්වර ආර්ථිකය මත ප්‍රධානත්වය දරයි. එහි වෙලඳපොල ප්‍රතිසංස්කරන ක්‍රියාමාර්ගය චීනය පුරා දුප්පතුන් හා පොහොසතුන් අතර සමාජ අගාධය බෙහෙවින් ගැඹුරු කර ඇති අතර හාන් චීන ස්වෝත්තමවාදය මත එහි දේශපාලන රඳපැවැත්ම ටිබෙට් හා අනෙකුත් ජාතික සුලුතරයන් සමඟ ආතතිය උග්‍ර කර තිබේ. අව්‍යාජ සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනයක් සඳහා අරගලයකින් බැහැරව රටේ ඕනෑම කොනක වැඩ කරන ජනතාව මුහුනදෙන පීඩාකාරී තත්වයන්ට විසඳුමක් ඇත්තේ නැත.

## පන්ති ප්‍රශ්න

මාධ්‍ය හා විවිධ විරෝධතා කන්ඩායම් සර්ව ලෝක පරිමානව ම පාහේ ටිබෙටයේ නොසංසුන්තාවය සලකන්නේ එය ආගමික හා සංස්කෘතික පීඩාව පිලිබඳ කාරනයක් ලෙස ය. ඔවුහු යටින් දිවෙන ආර්ථික ක්‍රියාවලීන් නොසලකා හරිති. ටිබෙටය තුලට වෙලඳපොල සම්බන්ධතාවන් විනිවිදීම විශේෂයෙන් ම වසර 2000 දී දියත් කල මහා බටහිර සංවර්ධනය නැත්නම් "බටහිරට යනු" ප්‍රතිපත්තිය යටතේ යටිතල පහසුකම් සඳහා ආන්ඩුවේ දැවැන්ත සහනාධාර මඟින් සනිටුහන් කල ව්‍යාපාරික කටයුතුවල පුපුරා හැලීමකට තුඩුදුන්නේය. 2006 වසරේදී විවෘත කල ක්වින්ගායි-ටිබෙට් දුම්රිය මාර්ගය ආයෝජන ගලනය වේගවත්

කලේය. එහෙත් වාර්ගික ටිබෙට් ජාතිකයන්ගේ අති මහත් බහුතරයට ඉන් කිසිදු වාසියක් සැලසුනේ නැත. ටිබෙට් ප්‍රභූ පැලැන්තියේ සුලුකොටසක් වාසි ලබාගත් අතර ටිබෙට් තරුනයන්ගෙන් සියයට 80 ක් විරැකියාවට ද, ජනගහනයෙන් තුනෙන් එකකට වැඩි ප්‍රමානයක් නිල දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවිතයකට ද වැටී සිටියි.

ලාෂාහි සිට වාර්තා කරමින් *වෝල් ස්ට්‍රීට් ජර්නලය* මාර්තු 27 වන දින මෙසේ ලිවීයඃ " ප්‍රචන්ඩත්වය භික්ෂූන් කුඩා කන්ඩායමක් විසින් උසිගන්වා ඇතැයි ආන්ඩුව අවධාරනය කරන නමුදු සම්මුඛ සාකච්ඡාවලින් පැහැදිලි වන්නේ ජනතාවගෙන් විශාල සංඛ්‍යාවක් ඊට සම්බන්ධ වී ඇති බවත් අමතර සාධක ද ක්‍රියාත්මකව ඇති බවත් ය. එක් ආන්ඩුවේ නිලධාරියෙක් ප්‍රකාශ කලේ කොල්ලකෑමට සහභාගීවන මිනිසුන්ගෙන් බොහොමයක් රැකියා නොමැති තරුනයන් බවය." එක් අතෙකින් ඉඩම් සඳහා ද අනෙක් අතට ලාභ ශ්‍රමය සඳහා ද ඉල්ලුම වැඩිවෙද්දී නගරය තුලට ඒමට බලකෙරුනු හිටපු ගොවීන් හා ගොපල්ලන් බහුතරයක් සහිත ලාෂාහි ටිබෙට් ජාතිකයන් අතර අපේක්ෂා භංගත්වය නැගිටීමට තුඩුදුන් බව අනෙකුත් වාර්තා පෙන්වා දුන්නේය.

චීනය සිය නිෂ්පාදන පදනම පුලුල් කිරීමටත් ඈත පිටිසර ප්‍රදේශවල ප්‍රයෝජනයට නොගත් ඛනිජ සම්පත් ගරා ගැනීමටත් උත්සාහ දරන අතර වාරයේ ව්‍යාපාරික කටයුතුවලට ඇතිවූ උන්මාදනීය පොරය මාර්තු 17 වන දින *බිස්නස්වීක් සඟරාව* පෙන්වා දුන්නේය. බටහිර චීනයේ ස්ථාවර වත්කම් ආයෝජනය පසුගිය වසරේදී ඩොලර් බිලියන 397 දක්වා සියයට 28 කින් ඉහල ගියේය. මෙයින් බිලියන 40 ක් යටිතල පහසුකම් හා අනෙකුත් වැඩ සටහන් සංවර්ධනය සඳහා මධ්‍යම ආන්ඩුව විසින් ආයෝජනය කරන ලදී. චීනයේ බටහිර ප්‍රාන්තවල ආර්ථික වර්ධන අනුපාතිකය 2007 වසරේදී සියයට 14.5 වූ අතර ටිබෙටයේ එය සියයට 17.5 ක් විය. මෙය ජාතික සාමාන්‍යයට වඩා බෙහෙවින් ඉහල අගයකි.

*බිස්නස්වීක් සඟරාව* මෙසේ ප්‍රකාශ කලේයඃ " නව මාවත්, ගුවන් තොටුපලවල් හා විදුලි බලාගාර ඉදිකිරීම් වැනි නිපුන හා වැඩි වැටුප් ලබන රැකියාවන් ලබාගත්, කලාපයට සංක්‍රමනය වූ මිලියන ගනනක් වන හාන් චීන ජාතිකයන් ඉලක්ක කර ගෙන වාර්ගික අසංතුෂ්ඨිය පලකිරීමට උදව් වූයේ එම තත්වයයි.. විවේකාගාර හා කුඩා වෙලඳසැල් ඇතුලත් කුඩා ව්‍යවසායක නාගරික ව්‍යාපාර බොහොමයක් ක්‍රියාත්මක වන්නේ සංකේතාත්මකව චීන ව්‍යවසායන් ලෙසය. ඒක පුද්ගල ග්‍රාමීය සමස්තයේ ආදායම නාගරිකයේ ආදායමට වඩා තුනෙන් පංගුවකටත් වඩා අඩු ඩොලර් 583 ක් වන අතර නාගරික - ගම්බද ජනගහනය චීන නාගරික හා සුලු ජාතික ගම්බද වශයෙන් බෙදී ඇති බටහිර දී එය වඩාත් අසාදෘ වී තිබේ. ටිබෙට් හි ග්‍රාමීය ආදායම ඩොලර් 393 ක් නැතහොත් නාගරික ආදායමෙන් හතරෙන් පංගුවක් වන අතර සිංජියැන් හි එය තරමක් වැඩි ඩොලර් 444 ක් පමනි.

වාර්ගික නොපනත්කම් සුලභ දෙයකි. ටිබෙට් තරුනයන් අතර ඉහල විරැකියා මට්ටමක් පැවතීමේ මූලික හේතුව රාජ්‍ය අධ්‍යාපනය චීන භාෂාවෙන් සිදුවීමයි. යම් අකාරයේ ද්විතීය අධ්‍යාපනයක් ඇත්තේ ටිබෙට් ජනගහනයෙන් සියයට 15 කට පමනි. බීජිනය උසස් අධ්‍යාපනය ලත් හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලත් අයට රැකියා සහතික කිරීමේ සිය ප්‍රතිපත්තිය අවසන් කලේ ටිබෙට් ජාතිකයන්ට තවත් අවාසි සලසමිනි. *ෆා ඊස්ටන් ඉකොනොමික් රිව්ව් සඟරාවේ* මෑතක පලවූ ලිපියක මෙසේ සඳහන් විය. "2006 වසරේදී ලාෂාහි ටිබෙට් විශ්ව විද්‍යාල සිසුන් අතර විශාල පෙලපාලියක් පැවැත්වුනි. හේතුව විවෘත තරගයකින් ආන්ඩුව ලබාදුන් සෑම රැකියා 100 කින්ම ටිබෙට් ජාතිකයන්ට ලැබුනේ රැකියා දෙකක් පමනක් වීමය. සාමාන්‍ය පරිදි ආන්ඩුව මේ තත්වයට ප්‍රතිචාර දැක්වූයේ මිල්ටන් ෆ්‍රීඩ්මාන් පවා ලජ්ජාවට පත්විය හැකි ආකාරයේ 'වෙලඳපොලේ' බලය ගැන විශ්වාසය දල්වමිනි."

සමාජ අසමානතාවය පිලිබඳ නොසතුට චීන බලධාරීන්ගේ ස්වෝත්තමවාදී ආකල්පයන් මඟින් කලතාලයි. චීන කොමියුනිස්ට් පක්ෂය (සීසීපී) හා වරප්‍රසාදිත නිලධරය විසින් තමන් සමාජවාදය නියෝජනය කරන්නේ යයි ද වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන් ආරක්ෂා කරන්නේ යයි ද කියා සිටීම බොහෝ දෙනා සලකන්නේ විකාරයක් ලෙසය. එහි ප්‍රතිඵලයක් ලෙස පාලන තන්ත්‍රය මෙම දෘෂ්ටිමය හිඩැස පියවීම සඳහා ද ධනපති හා මධ්‍යම පන්තික ස්ථරයන්ගේ සහාය ගොනුකර ගැනීම සඳහා ද චීන ජාතිකවාදය ඉදිරියට ගනියි. මෙම ප්‍රතිගාමී දෘෂ්ටිවාදය මාධ්‍යගතව ඇත්තේ ඊනියා "ම්ලේච්ඡයන්" ලෙස හඳුන්වන ටිබෙට් හා අනෙකුත් සුලු ජාතීන් මෙන්ම ජපන් හා කොරියානු වැනි අනෙකුත් ආසියානු ජනයාගේ ද අධිරාජ්‍ය ආරක්ෂකයා වූ ඉපැරනි "මධ්‍යම රාජධානියේ" අභිමානය මතය. සැබවින්ම එවන් ඇමතීම් කිරීමේදී චීන නායකයන්ට, 19 වන සියවසේදී හා 20 සියවස මුල අධිරාජ්‍යවාදී බලයන් විසින් එරට යටත්කරගෙන සිටීමේ දිගු ඉතිහාසයම අවුස්සා ගැනීමට හැකි වී තිබේ.

ටිබෙට් ජාතිකයන් පසුගාමීන් හා හිංසාකාරීන් ලෙස පිංතාරු කිරීමේ ප්‍රචාරක ව්‍යාපාරයක් සමඟ වාර්ගික ආතතීන් තවදුරටත් ගිනි ඇවිලවීම සඳහා ටිබෙට්හි නොසංසුන්තාවය ආන්ඩුව විසින් අල්ලාගෙන තිබේ. ගිනිබත් කල චීන ව්‍යාපාරික ස්ථාන හා වාහන දැක්වෙන වීඩියෝ පට මාධ්‍ය තුල නිමක් නැතිව ප්‍රතිචක්‍රීයකරනය කෙරේ. බොහෝ මරන හාන් චීන වැසියන්ට එරෙහි ටිබෙට් "මැර කල්ලි"වල ක්‍රියාවන්

ලෙස හැඳින්වේ. නිලධාරීන් කියා සිටින්නේ ප්‍රචණ්ඩත්වයේ ඊලඟ වටයේදී ටිබෙට් "මරාගෙන මැරෙන කල්ලි" සම්බන්ධ විය හැකි බවයි. විදේශ නගර ගනාවක් තුල ටිබෙට් "බෙදුම්වාදීන්ට" එරෙහිව චීන ජාතිකයන්ගේ දේශප්‍රේමී "විරෝධතාවන්" ආන්ඩුව විසින් සංවිධානය කෙරුනි. ජනාධිපති සාකෝසි ඔලිම්පික් තරගවල සමාරම්භක උත්සවය වර්ජනය කිරීමට තර්ජනය කිරීමෙන් පසුව ඊට සමාන්තරව ප්‍රන්ස භාන්ඩ වර්ජනය කිරීමට චීන ජාතිකයන් කැඳවුම් කර තිබේ. එය 2005 වසරේදී චීන තරුනයන් විසින් ගෙනගිය ජපන් විරෝධී හා ස්වෝත්තමවාදී උද්ඝෝෂනයට සමානකම් දක්වයි.

හාන් චීන ස්වෝත්තමවාදයේ තර්ජනයට ලක්ව ඇත්තේ ටිබෙට් ජාතිකයන් පමනක්ම නොවේ. ෂින්ජියාන් ප්‍රාන්තයේ මුස්ලිම් උයිගුර් සුලුතරය මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සඳහා ගෙනයන උද්ඝෝෂනවලට එරෙහිව ද මේ හා සමාන ක්‍රියාවලීන් දියත්ව ඇත. චීනය තුල මිලියන 100 කට අධික මැන්චූරියානු ජාතිකයන් වාසය කල ද, අද දින ඉන් 100 කට වත් මැන්චූරියානු භාෂාව කථාකල නොහැකි බව වාර්තා වී තිබේ. ඊට හේතුව එම භාෂාව සුරකීමට කිසිදු උත්සාහයක් නොමැති කමයි. බීජිනයේ ආකල්පය මුලුමනින්ම අවස්ථාවාදීය. මෑත වසරවල චීන බලධාරීන් හදිසියේම වාගේ සියවස් ගනනාවක් මුලුමනින්ම පාහේ අමතක කර දමා සිටි චීන යුදෙව්වන් කුඩා කන්ඩායමකගේ නීත්‍යානුකුල අයිතීන් හඳුනාගැනීමට සමත්ව සිටිති. ඒ අන් කිසිවක් නිසා නොව චීනයේ දෙවන විශාලතම ආයුධ සැපයුම් කරුවා වන ඊස්රායලය සමඟ සබඳතා ශක්තිමත් කර ගැනීම සඳහාය.

ටිබෙට් ජාතිකවාදය කිසිදු විසඳුම් මඟක් ඉදිරිපත් නොකරයි. මෑත වසරවල දී දලයි ලාමා ස්වාධීන ටිබෙට් රාජ්‍ය පංගුවක් සඳහා ඉල්ලීම් අතහැර දමා බීජිනය සමඟ සාකච්ඡාවලට කැඳවුම් කරන්නේ පිටුවහලේ සිටින ප්‍රභූ පැලැන්තියේ කොටස් ධනවාදයේ හා යම් ප්‍රමානයක ස්වාධීනත්වයේ පදනම මත පිම්බෙන චීනය තුලට යලි සංක්‍රමනය වීමේ උත්සුකය දනවමිනි. ටිබෙට් තරුන සංගමය වැනි තවත් රැඩිකල් කන්ඩායම් ප්‍රසිද්ධියේම දලයි ලාමාගේ "මැද මාවත" සමග විසංවාදී වන අතර "නිදහස් ටිබෙටයක්" සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරති. පවතින තත්වය එලෙස ම පැවතුනත් නැතහොත් ඉහත විකල්පයන්ගෙන් එකක් ක්‍රියාත්මක වුනත් ලාෂාහි එක් හෝ තවත් ධනපති කල්ලියක් විසින් ටිබෙට් ජනතාව සූරාකෑම එලෙසම පවතිනු ඇති අතර දෙකෙන් එක මාවතක් හෝ එයට විසඳුමක් නොවනු ඇත.

## ආර්ථික පසුගාමිත්වයේ ඉතිහාසයක්

ටිබෙටයේ වත්මන් තත්වය වනාහි අන් සියල්ලටත් වඩා චීනයේ නොවිසඳී ඇති ජාතික ප්‍රජාතන්ත්‍රීය කර්තව්‍යයන් විසඳීමෙහි ලා ධනේශ්වරයේ ඓන්ද්‍රීය නොසමත් කමේ නිෂ්පාදිතයකි. ක්වෝමින්ටැනයේ ධනේශ්වර ජාතිකවාදීන් (කේඑම්ටී) හෝ 1949 න් පසුව චීන ස්ටැලින්වාදීන් යන කවරෙකු හෝ රටේ සුලු ජාතීන්ට මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ලබාදී එම පදනම මත ඔවුන් ඒකාබද්ධ ජාතික රාජ්‍යයක් තුලට ඒකාග්‍ර කිරීමේ ලා අසමත් විය. ටිබෙට් ප්‍රභූ පැලැන්තිය සම්බන්ධයෙන් ගත්කල, පසුගිය සියවසේ ඉතිහාසය යලි යලිත් පෙන්නුම් කර ඇත්තේ විවිධාකාර මහා බලවතුන් ඉදිරියේ දනින් වැටීමේ ඔවුන්ගේ නිවට ක්‍රියා කලාපයයි.

චීනයේ ජාතික සුලුතරයන් නියෝජනය කරන්නේ ජනගහනයෙන් සියයට 10 කටත් අඩු ප්‍රතිශතයක් වුවත් ඔවුන් රටේ භූමි භාගයෙන් හරි අඩකටත් වැඩි කොටසක් පුරා විසිරී සිටිති. ටිබෙට්වරුන් සෑම විටම චීනයේ දුප්පත්ම ප්‍රධාන වාර්ගික ජන කන්ඩායම වන අතර වාසය කරන්නේ ආන්තික ලෙස ම හුදෙකලාවූ ද කටුක වූ ද ක්විංහායි - ටිබෙට් සානුව ආශ්‍රිතවය. සියවස් ගනනාවක් තුල ටිබෙටය සමාජ සංවර්ධනය අතින් කිසි විටෙකත් අතිරේක යැපුම් කෘෂිකර්මයේ අර්ධ නෝමැඩ් (එඬේර) ආර්ථිකයක මට්ටම ඉක්මවා නොගියේ ය. කලාපය පාලනය කරනු ලැබුවේ ඉඩම් හිමි රදලයන්ගේ සහාය ලැබූ දලයි ලාමා විසින් නායකත්වය දෙන ලද බෞද්ධ භික්ෂු තන්ත්‍රයක් විසින්ය. බොහෝ ටිබෙට් වරුන් ධර්මාශ්‍රමයන්ට හා ඉඩම් හිමියන්ට බැලමෙහෙවර කල "චබාස්" නැත්නම් නින්දගම් වැසියන්ය. බෞද්ධාගම ජනතාව සාමකාමී කිරීමේ මාධ්‍යයන් ලෙස පුලුල්ව පතුරුවාහරින ලද්දේ මිනිසුන් දුගී සමූහයක් බවට පත්ව ඇත්තේ පූර්ව ආත්මයන්හි ඔවුන්ගේ නොපනත් කම්වල ප්‍රතිඵලය ලෙසය යන විශ්වාසය සමඟින්ය.

අද "නිදහස් ටිබෙටයක්" සඳහා හඬ නගන අය උත්සාහ කරනුයේ ටිබෙට් රාජ්‍යයක් පිලිබඳ ඓතිහාසික සාක්ෂි මවාපෑමට ය. එහෙත් කලාපය තුල පැවති ආන්තික ආර්ථික පසුගාමීත්වය සෑම විටම ටිබෙට් පාලක පන්තීන් දේශපාලනික බෙලහීනත්වයට ඇද දමනු ලැබිනි. ටියුබෝ රාජවංශය යටතේ ටිබෙටය එක්සේසත් කල හත්වන හා නමවන සියවස්වල හැරෙන්නට සෑම විටම ටිබෙට් සානුව පසමිතුරු රදලයන් හා බෞද්ධ නිකායන් අතර බෙදී පැවතුනි. බෞද්ධ බලාධිකාරයේ ප්‍රමුඛත්වය කුබ්ලයිඛාන් වෙතින් අත්කරගනු ලැබූ අතර ඔහු 13 වන සියවසේ චීනය තුල මොන්ගොල් රාජවංශයේ මූලාරම්භකයා ද විය. ටිබෙටය ආක්‍රමනය කල ඔහු සිය ආධිපත්‍ය නීති යුක්ත කර ගත්තේ භික්ෂුභාවය යොදාගැනීමෙනි. චීන අධිරාජ්‍යයේ අනුග්‍රහය 1911 විප්ලවය දක්වා ම මිං හා මන්චූ රාජවංශයන් යටතේ අඛන්ඩව ක්‍රියාත්මක විය. චීන අධිරාජ්‍යයා හුදෙක් ටිබෙටයේ ලෞකික පාලකයා පමනක් නොවීය. ඔහු බෞද්ධ පූජනීයත්වයේ, එනම් "

ප්‍රඥාවේ ශ්‍රේෂ්ඨ බුදුන්" ලෙස හැඳින්වෙන මන්ජුෂූරියේ පුනරුත්පත්තිය ද විය.

ටිබෙට්හි ඊනියා නූතන "ස්වාධීනත්වය" චීන අධිරාජ්‍ය පද්ධතියේ දිරාපත්වීම හා බිඳ වැටීමේ අතුරු ඵලයක් විය. බීජිනයේ බලපෑම ක්ෂයවී යාමත් සමඟ මධ්‍යම ආසියාව තුල ආධිපත්‍ය හා බලපෑම සඳහා රුසියාව හා බ්‍රිතාන්‍ය ගෙනගිය කුමන්ත්‍රනයේ හා පොරවැදීමේ "මහා ක්‍රීඩාවේ" කොටසක් බවට ටිබෙටය පත්විය. 1904 වසරේදී බ්‍රිතාන්‍ය සිය ගනන් නොවේනම් දහස් ගනන් ටිබෙට් සොල්දාදුවන් ඝාතනය කරමින් ලාෂා නගරය අල්ලාගැනීම සඳහා යටත් විජිත ඉන්දියාවේ සිට ආක්‍රමනික හමුදාවක් ටිබෙටය වෙත පිටත් කර හැරියේය. කලාපය නිල වශයෙන් ඈඳ නොගත්ත ද එය අර්ධ බ්‍රිතාන්‍ය කොලනියක් බවට ඍජුව ම පරිවර්තනය කල ගිවිසුමක් බ්‍රිතාන්‍ය බලධාරීන් විසින් අටවනු ලැබිනි. බීජිනයේ දුබල මන්චු රාජසභාවට ලාෂාහි බ්‍රිතාන්‍ය ප්‍රමුඛතාවය පිලිගන්නවා හැර කලහැකි වෙනත් දෙයක් නොවීය.

මන්චු රාජවංශය පෙරලා දැමූ 1911 විප්ලවයේ නායකයා වූ සුන් යත් සෙන් හාන්, මැන්චූරියන්, මොන්ගෝලියානු, මුස්ලිම් හා ටිබෙට් යන "පංච වාර්ගික එකමුතුවේ" පදනම මත ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් ප්‍රකාශයට පත් කලේය. ඒකාබද්ධ ජාතික වෙලඳපොලක් තුලට ටිබෙටය ඒකාග්‍ර කිරීම සඳහා දුම්රිය මාර්ගයක් ප්‍රථම වරට යෝජනා කලේ ද ඔහුය. කෙසේ වුව ද ඔහුගේ ක්වෝමිංටැනය (කේඑම්ටී) එම දැක්ම සාක්ෂාත් කිරීමට අසමත් විය. එහි දුබලතාවයෙන් පිලිබිඹු කලේ අධිරාජ්‍යවාදයට යටත්වූ ද පරපුටු ඉඩම් හිමි පන්තියට ගැටගැසුනා වූ ද චීන ධනේශ්වරයේ බෙලහීන කමයි. මන්චූ රාජසභාව බිඳ වැටීමෙන් පසුව වැඩවසම් ඉඩම් හිමියන් කුඩා අධිරාජ්‍යයන් කපා වෙන්කර ගැනීමත් සමඟ චීනය කැබලිවී ගියේය.

ටිබෙටය කිසිදු විරුද්ධත්වයකින් තොරව බ්‍රිතාන්‍ය භාරකාරත්වය යටතේ "ස්වාධීනව" පැවතුනි. 1914 දී බ්‍රිතාන්‍ය ටිබෙටය ඇතුලත හා පිටත ටිබෙටය වශයෙන් බෙදා වෙන්කලේ වර්ග කිලෝ මීටර් 9000 ක් වයඹදිග ඉන්දියාවට අනුබද්ධ කරමිනි. ඉතිරි භූමි භාගය චීනයේ කොටසක් ලෙස බ්‍රිතාන්‍ය පිලිගනු ලැබුව ද ලංඩනයේදී අඳින ලද දේශ සීමාව ඉන් පසුව බලයට පැමිනි චීන ආන්ඩු විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එවකට "මැක් මැහෝන් රේඛාව" ලෙස හඳුන්වන ලද මෙය 1962 දී චීනය හා ඉන්දියාව අතර දේශසීමා යුද්ධයට වේදිකාව සකස් කලේය.

බෙලහීන කේඑම්ටී පාලන තන්ත්‍රයට ප්‍රාදේශීය යුද දෙටුවන් පරාජය කලහැකි වූයේ 1925-27 අතර කාලයේ ඇතිවූ කම්කරු පන්තියේ හා ගොවීන්ගේ විප්ලවකාරී නැගිටීම්වල ප්‍රතිඵලයක් වශයෙන් පමනි. එයට බලයේ රැඳීසිටීමට හැකිවූයේ චීන කොමියුනිස්ට් පක්ෂය (සීසීපී )කේඑම්ටී යට යටත් කිරීම මගින් හා එහි නායක චියැං කායි- ෂෙක් ට 1927 දී චීන කම්කරු පන්තිය ලේ විලක ගිල්වීමට ඉඩ සැලසූ මොස්කව්හි ස්ටැලින්වාදී නිලධරයේ ද්‍රෝහි ප්‍රතිපත්තිවල පිහිටෙන් ය. 1931 දී ජපානය මැන්චූරියාව අක්‍රමනය කිරීමට පෙර ඔහුගේ බලයේ උච්ජතම අදියරේ දී පවා ටිබෙටය ද ඇතුලත් බටහිර චීනයේ විශාල ප්‍රදේශවල පාලනය සියතට ගැනීමට කිසිවිටෙකත් චියාන්ට හැකිවූයේ නැත.

## ටිබෙටයේ 'විමුක්තිය'

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව දේශපාලන සිතියම ප්‍රගාඪලෙස වෙනස්විය. 1927 පරාජයෙන් ඉක්බිත්තෙහි මාඕ සේතුංගේ නායකත්වය යටතේ සීසීපී ය සමාජවාදී ජාත්‍යන්තරවාදයේ ඉදිරිදර්ශනය ද සමඟින් කම්කරු පන්තිය ඉවත දමා ගොවි ගරිල්ලාවාදය දෙසට හැරුනි. 1949 දී කේඑම්ටී තන්ත්‍රය පුපුරවා හරිමින් මාඕගේ ගොවි හමුදාවන් බලයට පත්වීම සමාජවාදයේ ජයග්‍රහනය සලකුනු නොකලේය. මාඕවාදී තන්ත්‍රය නගරවල කම්කරු පන්තිය මඩිනු ලැබූ අතර මහජන සමූහාන්ඩුවක් ගොඩනගනු ලැබුවේ පැහැදිලි ලෙසම තායිවානය වෙත පලා නොගිය චීන ධනේශ්වරයේ කොටස් සමඟ සන්ධාන ගත වෙමින්ය.

ජාතික සුලු ජන කොටස් කෙරෙහි වූ සීසීපීයේ ප්‍රතිපත්තිය සමාජවාදයේ පදනම මත විවිධ වාර්ගික පසුබිම් සහිත වැඩ කරන ජනතාව ඒකාබද්ධ කිරීමේ ජාත්‍යන්තර ක්‍රියාමාර්ගයක කොටසක් නොවීය. ඊට වෙනස්ව එහි "නව ප්‍රජාතන්ත්‍රවාදී" ක්‍රියාමාර්ගය පදනම් වූයේ ධනේශ්වරයේ ඓතිහාසික අභිලාෂයන් මෙන්ම චීන ගොවි ජන කොටස් අතර ප්‍රචලිතව පැවති ස්වදේශික උන්මාදය පිලිබිඹු කල "ශක්තිමත් බලවතෙක්" බවට චීනය පරිවර්තනය කිරීමේ ජාතිකවාදී අරමුනු මතය. "මහා හාන් ස්වෝත්තමවාදය" රටේ වාර්ගික ආතතීන් බෙහෙවින් උත්සන්න කලබව 1950 ගනන්වල මාඕ ද පිලිගෙන තිබුනි.

ටෙන්සින් ගියට්සෝ නමැති වත්මන් දලයි ලාමා 1935 දී ගොවි පවුලක උපත ලැබීය. 13 වන දලයි ලාමාගේ මරනයෙන් පසුව ඔහුගේ පුනරුත්පත්තිය ලෙස හෙතෙම වයස අවුරුදු දෙකේදී ඒ සඳහා තෝරා පත් කර ගන්නා ලදී. 1940 දී සිදුවූ ඔහුගේ කිරුලු පැලඳීමට චීනය තුල දූතමෙහෙවර යලි පිටුවාගෙන සිටි කේඑම්ටී නියෝජිත කන්ඩායමක් ද සහභාගී විය. 1947 ඉන්දියාවට නිදහස ප්‍රදානය කිරීමෙන් පසුව කලාපය තුලින් බ්‍රිතාන්‍යයේ නික්ම යාම හූ දේශපාලනික රික්තයක් ඇතිකලේය. කෂාග් නැතහොත් ලාෂාහි ටිබෙට් කැබිනට් මඬුල්ල බීජිංහි "කොමියුනිස්ට්" තන්ත්‍රයේ නැගී ඒම කෙරෙහි ගැඹුරින්ම පසම්තුරු වූ අතර සිය ස්වාධීනත්වය රැකගැනීම පිනිස ලංඩන් හා නවදිල්ලිය අතර උපාමාරු දැමීමේ නිරත විය.

මහජන විමුක්ති හමුදාවන් (පීඑල්ඒ) විසින් 1950 දී සිදුකල ටිබෙට් ආක්‍රමනයට මූලික අභිප්‍රේරනය සැපයුවේ, තායිවානයේදී මෙන්ම කේඑම්ටීයේ සතුරු ක්‍රියාකාරකම්වලට වොෂින්ටනය විසින් පිටුබලය දෙන තවත් තෝතැන්නක් බවට කලාපය පත්වීමට ඉඩ නොදීමේ බීජිංහි අභිලාෂයන් මගින්ය. කලාපයේ ඉරනම තීරනය වූයේ එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් යුත් බටහිර හා සෝවියට් කඳවුර අතර සීතල යුද්ධයේ සන්දර්භය තුලය. ආරම්භයේදී එක්සත් ජනපදය මෙන්ම බ්‍රිතාන්‍යය ද ආධාර සඳහා කෂාගය කල ඉල්ලීම් කෙරෙහි කිසිදු අවධානයක් යොමු නොකලේය. කෙසේවුවද කොරියානු යුද්ධය පුපුරායෑමෙන් පසුව වොෂින්ටනය ටිබෙටය කෙරෙහි සිය අවධානය යොමු කලේය. 1950 ගනන් මුල් අවධියේ සීඅයිඒ සංවිධානය මෙහෙයුමක් සඳහා දලයි ලාමාගේ සහෝදරයින් දෙදෙනෙකු බඳවාගත් අතර අවසානයේදී මුලු මහත් ටිබෙට් තන්ත්‍රයම පාහේ එයට ඇතුලත් විය.

1951 දී කුඩා ටිබෙට් හමුදාව පීඑල්ඒ විසින් පරාජය කිරීමෙන් පසුව බීජිනය සමඟ "කරුනු 17"ක ගිවිසුමකට එළඹීමට කෂාගයට බලකෙරුනි. ලාෂාහි පාලනයට යටත් ප්‍රදේශයන් ඉහල මට්ටමක දේශපාලන ස්වාධීනත්වයක් පවත්වාගත යුතුයයි ගිවිසුමෙන් සහතික වූ නමුදු එය චීනයේ කොටසක් විය යුතුය. දුගී ටිබෙට් ගොවීන්ට ආමන්ත්‍රනය කරනවා වෙනුවට මාඕ ප්‍රභුත්වයේ හා ඉහල බෞද්ධ සථරයේ වරප්‍රසාදිත තත්වය සහතික කලේය. චීනයේ අනෙකුත් කොටස්වලදී මෙන් නොව ටිබෙටයේදී මාවෝ ප්‍රවේනි දාසකම අහෝසි නොකල අතර සීමිත ඉඩම් ප්‍රතිසංස්කරන පවා ක්‍රියාත්මක නොකලේය.

එම ප්‍රතිපත්තිය තුල අනාගත ගැටුම් වල බීජ අන්තර්ගත විය. සැලකිය යුතු කිසිඳු මහජන සහයෝගයකින් තොර වීම නිසා සීසීපී ය සිය පාලනය පදනම් කිරීමට උත්සාහ කලේ බෞද්ධ තන්ත්‍රයේ ඉහල කොටසෙහි අංක දෙකේ නායකයා වන පංචන් ලාමා නායකත්වය දරන "දේශප්‍රේමී මුදුන් ස්ථරයේ" කොටස් දිනාගැනීම මතය. දැවැන්ත පීඑල්ඒ සේනාංකයක් පවත්වාගැනීමේ බරට කරගැසීමට සිදුවූයේ ගම්බද දුගීන්ටය. එය චීන විරෝධී මනෝගතියට තෙල් වැක්කිරීමක් විය. අවසානයේදී මාඕ ඉඩම් ප්‍රතිසංස්කරන ක්‍රියාත්මක කලේ අවශ්‍ය තාක්ෂනික සම්පත් නොමැතිව ද, ඉන් ටිබෙටයේ අර්ධ යැපුම් මට්ටමේ ගොවීන් හා එඬේර ජනතාව මත ඇතිකල හැකි බලපෑම ගැන නොතැකීමෙන් හා වඩාත් දැඩි සාමූහිකකරන පිලිවෙත් නිධාරිවාදී ලෙස යොදාගනිමිනි. එම පියවරයන් ගොවීන්ගේ සහාය දිනාගැනීමට අසමත් විය. ඉන් ටිබෙට් ප්‍රභු පැලැන්තියට සිය ප්‍රතිගාමී දේශපාලන අරමුනු සඳහා ජනතාවගේ නොසතුට ගසාකෑමේ හැකියාව ඇති කලේය.

## 1959 කැරලි

ප්‍රතිසංස්කරන පියවරයන් 1956 දී ටිබෙට් ප්‍රදේශ තුල කැරලි ගැසීම් රැල්ලකට තුඩුදුන්නේය. සීඅයිඒ විසින් සමහර කැරලිකාර කන්ඩායම්වලට ආයුධ සපයා ඔවුන් පුහුනු කලේය. කෙසේ වුව ද සීසීපී යට එරෙහිව 1959 දී හටගත් වඩාත් විශාල කැරැල්ල හුදෙක් විදේශ ඒජන්තයන් හෝ ඉඩම් හිමියන් විසින් උසිගැන්වූයේ නොවේ. එය මුල් බැස තිබුනේ පීඑල්ඒ හි මිලිටරි වාඩිලෑමට හා සීසීපී පක්ෂ නායකයන්ගේ ස්වෝත්තමවාදයට එරෙහිව පුලුල් ලෙස පැතිර පැවති විරුද්ධත්වය තුලය. එය පැනනැංගේ මහා ඉදිරි පිම්ම නමැති මාඕගේ ග්‍රාමීය සමාජවාදය පිලිබඳ මනෝරාජික අත්හදාබැලීමේ ව්‍යසනකාරී අසාර්ථකත්වය හා ඉන් පසු පුලුල්ව පැතිර ගිය සාගතයත් සමග ම වාගේ ය.

එක් ඉතිහාසඥයෙක් මෙසේ සඳහන් කරයි. " පසුකාලයක චීනයේ කියාපෑම් වලට පටහැනි ලෙස ටිබෙට් ගොවිජනතාව බලමුලු ගැන්වීමට කොමියුනිස්ට්වාදීන් කිසිවක් නොකල තරම්ය. ඔවුන් විවෘත ලෙස පන්ති විඥානය හෝ සමාජවාදය නැංවීමට කිසිවක් කලේ ද නැත. යම්තාක් දුරකට ඔවුන් පැවති තත්වය එලෙසම පිලිගනිමින් ටිබෙට් ගොවිජනතාව වේලාව පැමිනි විට පන්ති අවශ්‍යතාව පෙරට තබා කොමියුනිස්ට් පක්ෂයට සහාය දෙනු ඇතැයි විශ්වාස කලහ. 'ප්‍රතිසංස්කරන ඉහල සිට' යන ප්‍රතිපත්තිය නිසා ටිබෙට් ගොවීන්ට සලකනු ලැබුවේ හොඳ පැත්තෙන් ඇඟිලි නොගැසීමේත් නරක පැත්තෙන් ලාභ ශ්‍රම සූරාකෑමේ මූලාශ්‍රයක් ලෙසත් ය. (සෙරින් ශක්යා, *The Dragon in the Land of Snows: A History of Modern Tibet Since 1947,* හිම පොලවේ මකරා - 1947 පටන් ටිබෙටයේ නූතන ඉතිහාසය, 134 පිටුව, පිම්ලිකෝ)

ප්‍රචලිත මිත්‍යාවට පටහැනි ලෙස 24 වියැති දලයි ලාමා 1959 නැඟිටීමේ ප්‍රමුඛයා නොවූ නමුදු ප්‍රධාන කොට ම දුගී ගොවීන් හා ශිල්පීන් අතර විරෝධතාවේ සංඛේතාත්මක ආකර්ෂනීය ලක්ෂය විය. ඔවුන් සීසීපී යට පමනක් නොව පැරනි ඉඩම් හිමි ප්‍රභුවට ද විරුද්ධ විය. 1959 මාර්තු 10 වන දින චීන මිලිටරිය දලයි ලාමා පැහැරගෙන යාමට සූදානම් වන බවට පැතිර ගිය කටකථා මධ්‍යයේ ලාෂාහි දුගීන්ගේ පෙලපාලි පැනනැගුනි. බීජිනය සමඟ පැවති සම්බන්ධතා මත දිගු කලක් තිස්සේ භේද භින්නව පැවති කෂාග් ආන්ඩුව මෙම ව්‍යාපාරය මගින් පක්ෂඝාත කරනු ලැබිනි. එහි සමහර නිලධාරීන් චීන විරෝධී මනෝගතීන් අවුස්සනු ලැබුව ද දලයි ලාමා බීජිනය මෙන්ම ජනතාව ද සංසිඳුවීමට වෑයම් කලේය. ඔහුගේ එම උත්සාහයන් අසාර්ථක වූ අතර පීඑල්ඒ හමුදාවන් ලාෂාවට පහරදී දුබල ලෙස සන්නද්ධව සිටි විරෝධතා කරුවන් දහස් ගනනක් මරාදැමීමත් සමඟ ඔහු ටිබෙටය අතහැර පලා ගියේය.

සීසීපීයේ නිල වාර්තා ප්‍රකාශ කලේ කැරැල්ල දලයි ලාමා විසින් ප්‍රවේනිදාසත්වය යලි පිහිටුවීමට දරනු ලැබූ ප්‍රයත්නයක් වූ බවය. සැබවින්ම දලයි ලාමාගේ පලායාම කෙරෙහි මාඕගේ පලමු ප්‍රතිචාරය වූයේ "අප පරාජයවී ඇත" යන්නය. ඔහු දලයි ලාමා වැදගත් දේශපාලන අවියක් ලෙස සලකනු ලැබූ අතර මුලදී කියාසිටියේ ඔහු කැරලිකරුවන් විසින් පැහැරගෙන ගොස් ඇති බවය. අවසානයේදී සීසීපීය, දලයි ලාමා විවෘතව ම කොමියුනිස්ට් විරෝධය දේශනා කිරීමට පටන් ගැනීමෙන් පසුව ඔහු ද්‍රෝහියෙකු ලෙස හංවඩු ගැසීය. එක්සත් ජනපද සහාය ලැබුන ද පිටුවහලේ සිටි ටිබෙට් ආන්ඩුව කිසිවිටෙකත් ජාත්‍යන්තර පිලිගැනීමට ලක් නොවීය. එයට එක් හේතුවක් වූයේ වොෂින්ටනයේ අනෙක් මිතුරා වන තායිවානයේ කේඑම්ටීය එම කලාපය චීනයේ කොටසක් යයි කියාසිටීමයි.

මාඕගේ අභ්‍යන්තර සතුරන්ට එරෙහි කටුක අභ්‍යන්තර අරගලයක කොටසක් ලෙස 1966 දී මුදාහල "මහා නිර්ධන පන්තික සංස්කෘතික විප්ලවයෙන්" පසුව සීසීපී තන්ත්‍රය කෙරෙහි සතුරුකම් තවත් ගැඹුරු වූවා පමනි. 1964 දී ටිබෙටය පිලිබඳ මාවෝගේ පිලිවෙත ප්‍රවේශමෙන් විවේචනයට ලක් කල පංචන් ලාමා විරේක කිරීමෙන් සලකුනු කලේ ලියු ෂාකෝයී හා ඩෙන් ෂියාවෝ පෙං විසින් මෙහෙයවන ලද "ධනපති මග ගත්තවුන්ට" එරෙහි ප්‍රහාරයක ආරම්භයයි. බෞද්ධ ධර්මායතන හා ටිබෙට් සංස්කෘතික මධ්‍යස්ථාන වැනසීම මඟින් "වැඩවසම් කුනුකන්දල්" විනාශකිරීමට රතුභටයන් සිය අධිෂ්ඨානය පලකල විට පෙනීගියේ මාඕගේ අලා මුලාවූ තරුන කන්ඩායම් ටිබෙටය තුල සිදුකල අතිරේක ක්‍රියාකලාපයයි.

ටිබෙටය පිලිබඳ සීසීපීයේ ප්‍රතිපත්තිය තියුනු ලෙස බලහත්කාරී ඒකාබද්ධ කිරීම් වෙත යොමුවිය. චීනයේ අනෙකුත් ප්‍රදේශවලදී මෙන්ම ටිබෙට් වරුන් යාන්ත්‍රික ලෙස "දුගී ගොවීන්", "මධ්‍යම තරමේ ගොවීන්" සහ "ඉඩම් හිමියන්" වශයෙන් කාන්ඩවලට බෙදන ලද අතර අනුකූල ලෙස අනුග්‍රහ දැක්වීමට හෝ නොතකා හැරීමට බඳුන්කරන ලදී. මාඕ කෙරෙහි පක්ෂපාතිත්වය පලකරන රැස්වීම්වලට පැමිනීමටත් මාඕගේ නිලඇඳුම් පැලඳීම සඳහා සිය සම්ප්‍රදායික ඇඳුම ඉවත ලෑමටත් ටිබෙට් වරුන්ට බලකරන ලදී. තන්ත්‍රය අස්ථාවර කරන සීසීපීයේ අභ්‍යන්තර ආරවුල් නිසා ද, "සංස්කෘතික විප්ලවයේ" නිල රාමුවට පිටින් කම්කරු පන්තියේ විරෝධය හා කැරලි පැනනැගීමේ තර්ජනය ද හමුවේ රතු භටයන්ගේ වියරු කඩාපැනීම්වලින් පසුව එම ව්‍යාපාරය හදිසියේම ඇනහිටියේය. ටිබෙටය ද ඇතුලත් රටේ යථා පාලනය පිටුවීමටත් විරෝධතා පාගා දැමීමටත් මිලිටරිය කැඳවන ලදී.

පිටුවහලේ සිටි ටිබෙට් ආන්ඩුව 1960 ගනන්වල දී වොෂින්ටනයේ ද පිටුබලය ඇතිව යලි බලයට නැගගැනීමට බලාපොරොත්තු තබාගෙන සිටිය ද 1971 දී චීන පාලන තන්ත්‍රය සමඟ එක්සත් ජනපද ජනාධිපති නික්සන්ගේ රාජ්‍යතාන්ත්‍රික සබඳතා හේතු කොට ගෙන තත්වය හදිසියේ ම වෙනස් විය. ආර්ථිකය එකතැන පල්වීමේ තත්වය හා සෝවියට් සංගමය සමඟ ආතතීන් තියුනුවීම හමුවේ මාවෝ තමන්ගේ ම අධිරාජ්‍ය විරෝධී කයිවාරු සරදමට ලක් කරමින් වොෂින්ටනය සමඟ තත්කාර්යවාදී සබඳතාවයක් පිහිටුවා ගත්තේය. එම වැඩපිලිවෙලේ කොටසක් ලෙස එක්සත් ජනපදය තායිවානය හා ටිබෙටය මත චීනයේ ස්වාධිපත්‍ය පිලිගත් අතර දලයි ලාමා හා චියාංකායිෂෙක් ද ඇතුලු සිය කොමියුනිස්ට් විරෝධීන් බෙහෝ දෙනෙක් නොතකා හලේය. කුඩා ටිබෙට් ගරිල්ලා කන්ඩායම් පුහුනුකිරීම හා ඔවුන්ට ආයුධ සැපයීමේ සීඅයිඒ සහයෝගය වේගයෙන් සිඳී ගියේය.

වොෂිංටන්-බීජිං එකඟතාවය චීනය විදේශ ප්‍රාග්ධනයට විවෘත කිරීමේ ආරම්භය සලකුනු කලේය. මෙම ක්‍රියාවලිය 1976 මාඕගේ මරනයෙන් හා ඩෙං ෂියාඕපිං බලයට පැමිනීමත් සමග වේගයෙන් පුලුල් විය. 1980 ගනන් මුල මහජන සාමුහිකයන් විසුරුවා හැරීම, එම සාමුහිකයන් ආර්ථික ව්‍යසනයක් බව තහවුරුවී තිබුනු ටිබෙටය ද අතුලු අවශේෂ ප්‍රදේශයන්හි ගොවීන්ට තාවකාලික සහන ගෙන ආවේය. සිය " නිදහස්කිරීමේ" දෘෂ්ටිවාදයේ කොටසක් ලෙස සීසීපිය "සම්ප්‍රදායික" සංස්කෘතිය නගාසිටුවීම හා විහාරස්ථාන යලි ගොඩනැඟීම මඟින් බෞද්ධ වංශාධිකාරය සමඟ සබඳතාවන්ට පැලැස්තර දමාගැනීමට උත්සාහ කලේය.

## වෙලඳපොල ප්‍රතිසංස්කරන

විදේශ ආයෝජන දෙගොඩතලා යාම මඟින් දහනය කල චීනයේ වෙලඳපොල ප්‍රතිසංස්කරනවල සශ්‍රීකත්වය රට පුරා සමාජ ආතතීන් ප්‍රගාඪ ලෙස උත්සන්න කලා මිස සමනය කලේ නැත. පෙර පැවති සීමිත ආරක්ෂන ජාලය බිඳ විසිරුවා තිබෙන තත්වය තුල ධනේශ්වර වෙලඳපොලේ ආධිපත්‍ය මඟින් නිර්මානය කර ඇත්තේ තියුනුවන සමාජ ආතතීන් හා ගැඹුරුවන අතෘප්තියයි.

දුප්පත් ටිබෙට් කලාපය තුල විරෝධතා හා පෙලපාලි මඟින් පෙන්නුම්කර ඇත්තේ නොසංසුන්තාවයේ පුලුල් නැඟීඒමක නිමිති ය. 1989 ජනවාරියේ 10 වන පංචන් ලාමාගේ මරනය ටිබෙටය තුල සමාජ පිපිරීමකට තුඩුදුන්නේ, මියයාමට මඳකට පෙර ඔහු, 1949 පටන් ටිබෙටය අත්කරගත් දේට වඩා බොහෝ දේ ඊට අහිමිවී ඇතැයි කල ප්‍රකාශයක් පිලිබඳ කටකතා පැතිරයාමෙන් පසුවය. එවකට ටිබෙටයේ

පක්ෂ නායකයාව සිටි ජනාධිපති හූ ජින්ටාවෝ මාර්තු මාසයේදී ලාෂාහි කැරලි ප්‍රචන්ඩ ලෙස මඬිනු ලැබුවේ සිය ගනනක් නොවේනම් විශල පිරිසකට මරු කැඳවමිනි. ලාෂාහි කැරැල්ල සමාජ සමානතාවය හා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරන අරභයා අප්‍රේල් මාසයේ දී සිසුන් හා කම්කරුවන් විසින් ආරම්භ කල විරෝධතාවන් ලෙස පුපුරාගිය පලුල් අතෘප්තියේ නිමිත්තක් විය. බොහෝ අභ්‍යන්තර වාද විවාදවලින් පසුව සීසීපී තන්ත්‍රය 1989 ජූනි 4 වන දින බීජිංහි ටියනාන්මෙන් චතුරස්‍රයේ විරෝධතාකරුවන් මත ප්‍රචන්ඩ මිලිටරි ප්‍රහාරයක් මුදාහලේය.

ටියනාන්මෙන් චතුරස්‍රය තවමත් චීන තන්ත්‍රය තුල හොල්මන් කරයි. 1989දී පුපුරා ගිය සියලු සමාජ ප්‍රතිසතිතාවන් පසු කාලයේදී ඇතිවූ විදේශ ආයෝජනයන්ගේ කඩාවැදීම මගින් සම්මිශ්‍රිත හා උත්සන්න කෙරී ඇත. විරෝධතාවන් තලාදැමීම පිලිබඳ සියලු කිඹුල් කඳුලු හෙලීම් මධ්‍යයේ ගෝලීය විධායකයන් බීජිනයේ බලහත්කාරය යෙදීම, ඔවුන් කම්කරු පන්තියේ කුමන හෝ විරෝධයක් මැඬලනු ඇතැයි යන සහතිකයක් ලෙස වටහාගෙන සිටිති. නැගුනු ආර්ථික සංවර්ධනයේ ද දැවැන්ත උපරි ව්‍යුහාත්මක පිරිවැය ද ස්වදේශික ටිබෙට්වරුන් කොන්කර ඇති තතු යටතේ ටිබෙටය තුල සමාජ බෙදීම් විශේෂයෙන්ම උග්‍රය.

අප්‍රේල් 10 වන දින ද ඉකොනොමිස්ට් සඟරාව තුල බීජිනය පදනම් කරගත් ටිබෙට් විද්වතෙක් වන වැන් ලික්සියොන් චීනයේ පාලනයට එරෙහි අතෘප්තිය ටිබෙට් ගොවීන් හා රාජ්‍ය කම්කරුවන් අතරට ද පැතිර ගොස් තිබීමේ කාරනය සඳහන් කරමින් මෙසේ ලිවීය. "සැබවින්ම අද දින තත්වය 1980 ගනන් අග භාගයේ පැවති නොසංසුන්තාවයට වඩා බෙහෙවින් පුපුරන සුලුය. 'ටිබෙටය තුල 1987 හා යුද නීතිය පැනවූ 1989 අවසන් වරට ඇතිවූ නොසංසුන්තාවය ලාෂා අගනුවරට සීමාවූ අතර ඊට සම්බන්ධ වූයේද භික්ෂූන්, විද්වතුන් හා ශිෂ්‍යයන් පමනක් බවත් අද දින කැලඹීම් අනෙකුත් ටිබෙට් ප්‍රදේශ හා සියලු තරාතිරම්වල ජනතාව කරා ද පැතිර ගොස් ඇති'" බව ඔහු සඳහන් කරයි.

ටිබෙට් ජනතාව සඳහා විසඳුම වැටී ඇත්තේ දලයි ලාමා හා බීජිනය අතර සාකච්ඡාවන් තුල හෝ " ස්වාධීන" රාජ්‍ය පංගුවක් ඇතිකිරීම තුල හෝ නො වේ. වෙනම ටිබෙටයක් කිසිවටෙක ස්වාධීන, ප්‍රජාතන්ත්‍රවාදී හෝ එරට ජනගහනයේ මූලික සමාජ අවශ්‍යතාවන් සපුරාලිය හැකි එකක් නොවනු ඇත. 1950 දී ටිබෙටය චීනය තුලට ඒකාබද්ධ කරනු නොලැබුවේ නම් එය අනුගමනය කරනු ඇත්තේ අසල් වැසි නේපාලය, භූටානය මෙන් කුඩා, දුගී හා අනුන් මත යැපෙන පරමාධිකාරී රාජාන්ඩු ගත් මාවතම ය. " නිදහස්" ටිබෙටයක ඉරනම දැක ගැනීමට යමෙකු බැලිය යුත්තේ 1991 සෝවියට් සංගමය බිඳවැටීම හමුවේ ගොඩ නඟනු ලැබූ මධ්‍යම ආසියානු සමූහාන්ඩු දෙසය. එය මහා බලවතුන් අතර උග්‍රවන එදිරිවාදිකම්වල ක්‍රීඩා භාන්ඩයක් බවට පත්ව තිබේ.

කම්කරු පන්තිය විසින් සමාජවාදී ඉදිරිදර්ශනයක් සඳහා කරන ඒකාබද්ධ අරගලයකට පිටින් චීනයේ ද කලාපයේ ද කිසිදු ජාතික ගැටලුවක් විසඳිය නොහැකිය. ජාතික හා වාර්ගික අරගලයන්ගේ සීඝ්‍ර වර්ධනය වනාහි ලෝක ධනවාදයේ ද ජාතික රාජ්‍ය පද්ධතියේ ද අර්බුදය පිලිබඳ තවත් එක් නිමිත්තකි. 20 වන සියවස මුල භාගයේ චීනය හා ඉන්දියාව වැනි රටවල භාෂාමය, ආගමික හා වාර්ගික බෙදීම් කපාගෙන මහා ජනකායන් එකට ගෙනආ යටත් විජිත විරෝධී අරගල හා සසඳන විට අද දින ජාතික ව්‍යාපාර අවිචල්‍යව ම සුවිශේෂිත හා අපගාමී ය. අධිරාජ්‍යවාදයෙන් නිදහස පැතීමට බොහෝ දුරස්ත ලෙස ඔවුන් "තමන්ගේ ම" කම්කරු පන්තිය සූරාකෑම සඳහා ධනපති රාජ්‍ය පංගුවක් කපා වෙන්කර ගැනීමේලා මහා බලවතුන්ගේ පිටුබලය අපේක්ෂාවෙන් වෙහෙස නොබලා ක්‍රියා කරති.

ලාභ ශ්‍රමය හා සම්පත් සඳහා ඉල්ලුම මගින් දුවවනු ලබන චීන හා ලෝක ආර්ථිකය තුලට ටිබෙටය ඒකාග්‍ර කිරීම ටිබෙට් ජනතාව චීන හා ජාත්‍යන්තර කම්කරු පන්ති සමූහය තුලට ගෙනැවිත් තිබේ. ටිබෙට් ජනතාව අත්විඳින ප්‍රජාතන්ත්‍රීය අයිතීන් නොමැතිකම හා සමාජ කාලකන්නිකම ඉන්දියාව ද ඇතුලත් චීනය හා යාබද කලාපය පුරාම මිලියන සියගනනක් කම්කරුවෝ ද අත්විඳිති. ටිබෙට්වරුන්ගේ සමාජ හා ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් සාක්ෂාත් කල හැක්කේ ජාත්‍යන්තර සමාජවාදය සඳහා පුලුල් අරගලයක කොටසක් ලෙස බීජිංහි සීසීපී තන්ත්‍රය පෙරලාදැමීමට චීන කම්කරු පන්තිය සමඟ ගෙනයන ඒකාබද්ධ අරගලයකින් පමනි.

සියල්ලටත් වඩා මේ සඳහා අවශ්‍යවන්නේ ස්ටැලින්වාදයේ සියලු රූපාකාරයන්ට එරෙහිව ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ගෙනගිය දිග් ගැස්සුනු අරගලයෙන් අවශ්‍ය පාඩම් උකහාගැනීම හා කම්කරු පන්තියේ විප්ලවවාදී නායකත්වය ලෙස චීනය තුල හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවක් ගොඩනැගීම ය.

© www.wsws.org